කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට ඇති හැකියාව අවම කිරීම සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීම සඳහා මාධ්‍ය මගින් කොවිඩ්-19 වාර්තාකරණයේදී මෙම නිර්දේශයන් හා අනුකූල වීම අත්‍යාවශ්‍ය යැයි පැවසේ.

ඇතැම් මාධ්‍ය මෙම නිර්දේශයන් හා අනුකූල නොවන අවස්ථාවකට උදාහරණයක් ලෙසින් මව්බිම පුවත්පතේ පළවූ (11/05) මෙම සිරස්තලය දැක්විය හැක. "කොරෝනා රෝගීන් 9ක් නිසා රද්දොළුගම නිවාස 14 ක පුද්ගලයින් නිරෝධායනයට" යනුවෙන් එහි දැක්වේ. මේ ඔස්සේ, එම පුද්ගලයන්ට නිරෝධායනයට යොමු වීමට සිදුවීම එම ආසාදිතයන්ගේ වරදක් ලෙසින් නොදැක්වෙන්නේද? එසේ නම් එය ඉහත දක්වා ඇති නිර්දේශය කඩ කිරීමක් නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Mawbima**